# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2253/22 – 2021 නොවැම්බර් මස 10 වැනි බදාදා – 2021.11.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2021 අංක 233 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2017/UD/178.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: DS/GFG/L&L/05/94.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි. –** ප්‍රාදේශීය ලේකම්, කඩවත් සතර ගාල්ල.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රිච්මන්ඩ් කන්ද ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක GA/GFG/2017/829 හා 2017.12.26 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන් ගහ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1555**

උතුරට: සේන පී. පල්ලියගුරුගේ හිමිකම් කියන පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන්ගහ වත්ත සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට සහ දකුණට: කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ සේන පී. පල්ලියගුරුගේ හිමිකම් කියන පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන්ගහ වත්ත.

02. **කැබලි අක්ෂර 'B' – ප්‍රමාණය: හෙක්. 0.0143**

උතුරට: කැබලි අක්ෂර A, කාණුව සහ වක්වැල්ල පාර; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ වක්වැල්ල පාර; දකුණට: එස්. එච්. දහනායක මාවත සහ කැබලි අක්ෂර C; බටහිරට: කැබලි අක්ෂර C සහ කාණුව.

1A – G 35314 – 20 (2021/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. **කැබලි අක්ෂර 'C' – පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන් ගහ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.1453**

උතුරට: සේන පී. පල්ලියගුරුගේ හිමිකම් කියන පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන්ගහ වත්ත සහ කැබලි අක්ෂර B; නැගෙනහිරට: කැබලි අක්ෂර B සහ එස්. එච්. දහනායක මාවත; දකුණට: එස්. එච්. දහනායක මාවත, පී. සී. අබේසිරිවර්ධන හිමිකම් කියන කුරක්කන්ගහ වත්ත; බටහිරට: පී. සී. අබේසිරිවර්ධන හිමිකම් කියන කුරක්කන්ගහ වත්ත, හිමිකරු සොයාගත නොහැකි ඉඩම, සේන පී. පල්ලියගුරුගේ හිමිකම් කියන පුස්සගහ ඕවිට පුස්සගහ ඕවිට වත්ත සහ කුරක්කන්ගහ වත්ත.

11 - 559

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.